Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# පුබුදින පස් පියුම් - 2025

## ශිෂ්‍ය සාධනය ඉහළ නැංවීමේ වැඩසටහන

**5 ශ්‍රේණිය** | **පළමු පත්‍රය** | **කාලය පැය 01 යි.**

නම : ..........................................................................................

පාසල : ..........................................................................................

විභාග අංකය : ..............................

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්**


- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ නියමිත ස්ථානයේ දී ඔබගේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න. (සමහර ප්‍රශ්නවල අනු කොටස් ද ඇත.)
- සෑම ප්‍රශ්නයකටම පිළිතුරු 3 බැගින් දී ඇත. ඒවා අතුරින් එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.
- පිළිතුරු ලියන්නට ඇති ප්‍රශ්නවල පිළිතුරු තිත් ඉර මත ලියන්න.

| පිටු අංකය | | ලැබූ ලකුණු |
|---|---|---|
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |
| 06 | | |
| 07 | | |
| 08 | | |
| එකතුව | | |
| | අවසන් ලකුණු | |
| ඉලක්කමෙන් | | |
| අකුරෙන් | | |

| ප්‍රශ්න පත්‍ර අංක - 06 | කෙටි අත්සන හා සංඛේත අංකය |
|---|---|
| පළමු පරීක්ෂක<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම් කළ බව සහතික කරමි. | V/II/S |
| දෙවන පරීක්ෂක<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/II/S |
| ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක<br>ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/II/S |
| ප්‍රධාන පරීක්ෂක<br>අධීක්ෂණය කළෙමි අවසාන ලකුණ නිවැරදිය. | V/II/S |

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

01. පහත රූපය හොඳින් නිරීක්ෂණය කරන්න. රූප සටහන පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.







(1) ළමයාගේ වම් අත පැත්තේ ගෙයක් ඇත.

(2) බස්නාහිර දිශාවේ ඉර දැකගත හැක.


(3) ළමයාගේ වම් අත පැත්තෙන් ගසක් දැක ගත හැක.

02. පළමු කොටුව තුළ ඇති රූපයට වඩාත් සමාන රූපය තෝරා යටින් ඉරක් අඳින්න.


(1) (2) (3)

03. පහත දැක්වෙන සතුන් 1,2 , 3,5 සහ 4,6 ලෙස කාණ්ඩ කිරීමට යොදාගෙන ඇති සම්බන්ධතාව කුමක් ද?






1 2 3 4 5 6

(1) ජීවත් වන පරිසරය (2) ගන්නා ආහාර (3) පාද ගණන





04. 

මෙම රූපයේ සිටින ළමයා ඉදිරිපසටත්, ගැහැනු ළමයා පිටුපසටත් අනෙකුත් ඉරියව් වෙනස් නොකර හැරුණු විට ඔවුන් දෙදෙනා සිටින ආකාරය දැක්වෙන නිවැරදි රූපය කුමක් ද?

(1) (2) (3)


05. මුලින් දී ඇති රූපය එහි ඇති ඊ හිස ඉහළට සිටින වට භාගයක් (  ) දෙසට කරකවනු ලබයි. එවිට දැකිය හැකි ආකාරය පෙන්වන රූපය කුමක් ද?


   


(1) (2) (3)


Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

06. පහත රූප යෙදී ඇති රටාව අවබෝධ කරගෙන හිස් කොටුවට ගැළපෙන නිවැරදි පිළිතුර තෝරන්න.




(1)


(2)


(3)

07. පහත දී ඇති වාක්‍යයේ හිස්තැන් පිරවීමට වඩා සුදුසු වචන යුගලය ඇතුළත් පිළිතුර තෝරන්න.

කැලෑගමේ මිනිසුන් ඉවක් බවක් නොමැති ව ............................... කපා දමයි. ඒ නිසා අනාගතයේ දී ඔවුන්ට ............................. මුහුණදීමට සිදුවනු ඇත.

(1) ගස්/නියඟයකට (2) ගස්/ගංවතුරකට (3) අතු/ලැව්ගින්නකට

08. පහතින් දැක්වෙන්නේ පොතකින් ඉරී ගිය කොටස් 4කි. එය තබා ඇත්තේ පිළිවෙලකට නොවේ. එය නිවැරදිව තැබිය යුතු පිළිවෙල තෝරන්න.

| | | | |
|---|---|---|---|
| ජීවත් වූ<br>ඇයගේ<br>ලොකු<br>අය | දැරියක්<br>තාත්තා,<br>වගේ<br>ජීවිත් | පුංචි<br>අම්මා,<br>අම්මා<br>ඒ සිහින වල | සිහිනයක<br>සිටියා ය.<br>අත්තම්මා,<br>පවුලේ ම<br>වුහ. |
| 1 | 2 | 3 | 4 |

(1) 4 2 1 3 (2) 3 1 4 2 (3) 4 1 3 2

09. මා කළ කාරිය කළ හැකි කිසිවෙක්
ඇත් දෑ බැස යන හිරු නැගි පැනයක්
හිමියනි මා හට කළ හැකි තරමක්
කරනෙමි පැවසී පොඩි මැටි පහනක්

ඉහත කවියෙන් කියැවෙන්නේ,

(1) හිරු ඉදිරියේ මැටි පහනේ එළිය යටපත් වී යන බවයි

(2) යම්කිසි කාර්යයක් කිරීමේ දී පුද්ගල තරාතිරම බල නොපාන බවයි.

(3) දුබලයෙකුට කිසිවිටෙකත් ශ්‍රේෂ්ඨයකුට ළං විය නොහැකි බවයි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

10. විශාලත්වය වැඩිවන අනුපිළිවෙළට යෙදෙන පිළිතුර තෝරන්න.

(1) නගරය, ගම, පළාත, දිස්ත්‍රික්කය, රට

(2) රට,දිස්ත්‍රික්කය, පළාත, ගම, නගරය

(3) ගම, නගරය, දිස්ත්‍රික්කය, පළාත, රට

11. 'කැලෑවේ එක් පැත්තක සිට අනෙක් පැත්තට දුවන්නට එළියට පැමිණි හාවෙක් කන් දෙක උඩ හිඳුවා බලා හිඳියි. ගස් මුදුන්වල මිහිරි හඬින් ගායනා කරමින් සිටි කුරුල්ලෝ ලැගුම් පළවල් සොයා යති.'


මෙම විස්තරය හොඳින් ගැළපිය හැක්කේ,

(1) උදෑසනකට (2) රාත්‍රියකට (3) සවසට

12. පහත වාක්‍යයේ හිස්තැන් දෙක සම්පූර්ණ කිරීම සඳහා වඩාත් ම සුදුසු වචන යුගලය කුමක් ද?

රමණීය කඳු පන්තියක් මැදින් .......................... අඩි පාරක 2 km ට ආසන්න දුරක් පා ගමනකින් දිය ඇල්ල ........................ යා යුතු ය.

(1) වැටුණු, නැරඹීමට (2) සැදුණු, කැපීමට (3) කැපුණු, නැරඹීමට

13.  යන සංකේත යොදාගෙන 'සරසන' යන වචනය ලියා තිබුණි. ඒ අනුව  සංකේත මඟින් අදහස් කරන වචනය කුමක් ද?

(1) සරල (2) සනස (3) සරන

14. අගය පිළිවෙළින් වැඩිවන ආකාරයට පහත සංඛ්‍යා පුවරු පෙළගැස්වීමට පුවරු කීයක් වෙනස් කළ යුතු ද?




(1) 2 (2) 3 (4) 4

15. දී ඇති ඉලක්කම් සටහනෙහි පහළට හෝ හරහට එක ළඟ ඇති ඉලක්කම් දෙකක එකතුව 9 වන පරිදි යෙදෙන අවස්ථා ගණන කීයද?


| | | |
|---|---|---|
| 1 | 7 | 2 |
| 8 | 1 | 7 |
| 6 | 5 | 4 |
| 3 | 4 | 3 |

(1) 7 (2) 8 (3) 9

16. නයනා මලිතිගේ අම්මා ය. නෙලුම් නයනාගේ බාල සහෝදරිය වේ. සදිල් මලිතිගේ එකම මල්ලී ය. සදිල් සහ නෙළුම් හමුවු විට සදිල්, නෙලුම් ඇමතිය යුතු නෑදෑකම කුමක ද?

(1) ලොකු අම්මා (2) නැන්දා (3) පුංචි අම්මා

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

17. 


රූප සටහනේ A, B, C, D, E, F යන ප්‍රදේශ හත රතු, කහ, සුදු හා රෝස යන වර්ණ වලින් පාට කළ යුත්තේ එක ළඟ ප්‍රදේශ එකම වර්ණයේ පාට නොවන ලෙසය.


G, C, හා A යන ප්‍රදේශ රතු, කහ, සුදු වර්ණ වලින් පාට කර තිබේ. ඒ අනුව පහත වාක්‍ය අතරින් නිවැරදි වාක්‍ය තෝරන්න.

(1) D සහ B ප්‍රදේශ පාට කර ඇත්තේ රෝස හා සුදු පාටින් ය.


(2) F සහ D ප්‍රදේශ පාට කර ඇත්තේ කහ හා රෝස පාටින් ය.

(3) E සහ B ප්‍රදේශ පාට කර ඇත්තේ රතු හා කහ පාටින් ය.

18. 1 රූපය මත 2 රූපය තබා ඒ මත 3 රූපය තැබූ විට දැකිය හැකි ආකාරය නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,



1 රූපය 2 රූපය 3 රූපය




(1) (2) (3)

19. රටාව හඳුනාගෙන හිස්තැනට ගැළපෙන සංඛ්‍යාව තෝරන්න.

F + H = 6 A + E = 7 K + L = 5 M + N = . . . . . .

(1) 7 (2) 8 (3) 9


20. එක්තරා සංදර්ශනයක ළමයි පෙළගැසී සිටි ආකාරය පහත සටහනේ දක්වා ඇත. එහි 'ඕලු' පමණක් නිරූපණය කර ඇත.





D සිට බැලූ විට 10 වෙනියාට ද B සිට බැලූ විට 9 වෙනියා ද, A සිට බැලූ විට 12 ට ද C සිට බැලූ විට 15 ට ද ඕලු සිටියි

මේ සන්දර්ශනයට සහභාගි වූ මුළු ළමයි ගණන වන්නේ.

(1) 47 (2) 46 (3) 43

21. 

A රූපය



B රූපය

A රූපය තුළ B රූපයේ හැඩයේ පිහිටීම් කීයක් දැකිය හැකි ද?

(1) 2 (2) 4 (3) 8

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com


22. ශාලා දෙකකින් එක් ශාලාවක සිටින මිනිසුන් සංඛ්‍යාව අනෙක් ශාලාවේ සිටින මිනිසුන් සංඛ්‍යාවේ දෙගුණයට වඩා පහකින් අඩු ය. ශාලා දෙකෙහි සිටින මිනිසුන් සංඛ්‍යාව විය හැක්කේ.

(1) 40 (2) 50 (3) 60

23. අනිද්දා 12 දාය. අම්මාගේ උපන්දිනය ඊයේ යැයි සජිත් කීවේ පෙරේදා ය. අද බදාදා නම් අම්මාගේ උපන් දිනය තිබුනේ කවදා ද?

(1) 7 වන ඉරිදා (2) 6 වන සෙනසුරාදා (3) 8 වන සඳුදා

24. පහත සම්බන්ධය බලන්න.




ඒ අනුව වෘත්ත 6 ක් සමාන වන්නේ ත්‍රිකෝණ හැඩ කීයකට ද?

(1) 6 (2) 8 (3) 10

25. කූරු 4 ක ගණක රාමුවක් සහ එහි සංඛ්‍යා නිරූපණය කිරීමට යොදා ගන්නා ගණක 26 තිබේ. එම ගණක සියල්ලට හිස් ගණක රාමුවකට දමන්නේ දහයස්ථානය, ඒකස්ථානය, දහයස්ථානය, සියස්ථානය යන ආදි රටාවටය. ඒ අනුව ගණක 26 ම ගණක රාමුවට දැමූ විට ගණක රාමුවේ නිරූපණය කරන සංඛ්‍යාව වන්නේ.

(1) 6677 (2) 6767 (3) 7667

26. පහත දැක්වෙන වෘත්ත රටාවකට වර්ණ ගන්වා තිබුණේ පහත පරිදි ය.




රතු හා රෝස වෘත්ත මැද නිල් වර්ණයෙන් යුතු වෘත්තයක් තිබුණි. නිල් හා දම් වෘත්තය මැද ඇති වෘත්තය රෝස පාටය. රතු සහ කහ වෘත්ත අතර මැද ඇති වෘත්තය අතර දම් පැහැ වෘත්තයක් ද තිබුණි.

මේ අනුව වෘත්ත වර්ණ ගන්වා තිබූ පිළිවෙල වන්නේ,

(1) කහ දම් රතු නිල් රෝස (2) කහ රතු නිල් රෝස දම්

(3) රතු නිල් රෝස දම් කහ

27. දවසේ අවස්ථා කිහිපයක දී එකම කණුවක සෙවණැල්ල සටහන් වී තිබූ ආකාරය පහත රූපයෙන් දැක්වේ. එම සෙවණැල්ල දවසේ වේලාව අනුව අනුපිළිවෙළකට සකස් කළහොත් ලැබෙන ආකාරය දැක්වෙන පිළිතුර කුමක් ද?




(1) E C A D B (2) A C D E B (3) B E D C A

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com


28. පහත දැක්වෙන්නේ රුපියල් 1, රුපියල් 2, රුපියල් 5, රුපියල් 10 කාසි වෙන වෙනම ගොඩ ගසා ඇති ආකාරයයි.




එක් ගොඩකින් කාසි එකක් ද, තව ගොඩකින් කාසි දෙකක් ද, තවත් ගොඩකින් කාසි තුනක් ද, ඉතිරි ගොඩෙන් කාසි හතරක් ද ගෙන සැකසිය හැකි වැඩි ම මුදල කීය ද?


(1) රුපියල් 45　　(1) රුපියල් 47　　(1) රුපියල් 53

29. A සිට B තෙක් යා යුත්තේ අඳුරු කර ඇති කොටු මග හරිමිනි. ඒ අනුව දුරින් අඩු ම මාර්ගයේ A සහ B අතර ඇති කොටු ගණන කීය ද?




(1) 8　　(2) 9　　(3) 10

30. එක හා දෙක තරාදිවල ඇති ද්‍රව්‍යවල බර නිරීක්ෂණය කර තුන්වන තරාදියේ බරට ගැළපෙන ද්‍රව්‍ය ඇතුළත් පිළිතුර තෝරන්න.




(1) 

(2) 

(3) 


31. හැඩයෙන් හා ප්‍රමාණයෙන් සමාන ඝනක දෙකක් රූපයේ දැක්වේ. ඒවා රූපයේ දැක්වෙන සේ 1 ඝනකය මත 2 ඝනකය තබා අලවයි. එවිට ලැබෙන ඝනකාභය මුලින් තිබූ ඝනකය හා සන්සන්දනය කළ විට දැකිය හැක්කේ.



(1) සැළැස්ම වෙනස් වී ඇත

(2) ඉදිරි පෙනුම වෙනස් වී ඇත.

(3) පැති පෙනුම වෙනස් වී ඇත.

32. 


මෙම රූපයේ දැක්වෙන තරාදිය සමබර ව පවතී. ඒ අනුව  හි බර කොපමණ ද?


(1) 10 kg

(2) 20 kg

(3) 25 kg

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

33. පහත දී ඇති රූප රාමුවලින් සිද්ධියක අවස්ථා හතරක් දැක්වේ. එය වඩාත් අර්ථවත් සිදුවීමක් ලෙස සකස් කිරීම සඳහා රූප සකස් කළ යුතු අනුපිළිවෙළ කුමක් ද?





(1) A C B D (2) B C D A (3) C D A B

34. ස්ථාවර දුරකථන අංක පුවරුවේ ඇති ඉලක්කම් සියල්ලම එකිනෙක ගුණ කිරීම මඟින් ලැබෙන අගය කීය ද?

(1) 0 (2) 9 (3) 45

35. පහත දී ඇති සටහනට අනුව දී ඇති ප්‍රකාශ අතුරින් නිවැරදි ම ප්‍රකාශය තෝරන්න.




(1) මෙහි වයසින් අඩු ම ළමයා රවිඳු ය.

(2) දුමිඳු පසිඳුට වඩා වයසින් වැඩිමහල් ය

(3) රවිඳුට වඩා වැඩිමහල් දුමිඳු පමණි.

36. පෙරේරා මහතාට සහ එම මහත්මියට ගැහැණු දරුවන් දෙදෙනෙක් සිටියි. ඔවුන් දෙදෙනාම විවාහ වී ඇති අතර එම ගැහැනු දරුවන් දෙදෙනාටම දරුවන් දෙදෙනා බැගින් සිටියි. එම පවුලේ සිටින පිරිස කීය ද?

(1) 8 (2) 6 (3) 10

37. නිරාෂාගේ පියාට ගැහැනු දරුවන් හතර දෙනෙකි. නයෝමි, නතාෂා, නදීශා ඒ අතරින් තිදෙනෙකි. අනෙක් දියණියගේ නම කුමක් ද?

(1) නිමේෂා (2) නිරාෂා (3) නිශ්චිතව කිව නොහැක.

38. ඔරලෝසු මුහුණතක පැය කටුව එක් සංඛ්‍යාංකයක සිට ඊට ප්‍රතිවිරුද්ධ සංඛ්‍යාංකයට ගමන් කිරීමේ දී අතරමග දී පසු කරන සංඛ්‍යාංක ගණන කීය ද?

(1) 4 (2) 5 (3) 6

39. ඉටිපන්දමක් සම්පූර්ණයෙන්ම දැවී යාමට ගතවන කාලය මිනිත්තු 10 කි. එවැනි ඉටිපන්දම් 10 ක් ප.ව. 7.00 ට එකවර දල්වූයේ නම් ඉටිපන්දම් සියල්ලම දැවී අවසන් වන වේලාව කීය ද?

(1) ප.ව. 7.10 (2) ප.ව. 7.40 (3) ප.ව. 8.40

40. සංඛ්‍යා රටාවක ඇති සංඛ්‍යාවකට, පෙර සහ පසු සංඛ්‍යා පිළිවෙලින් 55 සහ 65 වේ. එම සංඛ්‍යා රටාවේ පොදු අන්තරය කීය ද?

(1) 2 (2) 5 (3) 10

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# පුබුදින පස් පියුම් - 2025

## ශිෂ්‍ය සාධනය ඉහළ නැංවීමේ වැඩසටහන

**5 ශ්‍රේණිය** **දෙවන පත්‍රය** **කාලය පැය 01 යි මි. 15යි**

නම : ..............................................................................................................

පාසල : ..............................................................................................................

විභාග අංකය : ..............................

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ නියමිත ස්ථානයේ දී ඔබගේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 60 ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න. (සමහර ප්‍රශ්නවල අනු කොටස් ද ඇත.)
- පිළිතුරු තුනක් දී ඇති ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
- පිළිතුරු ලියන්නට ඇති ප්‍රශ්නවල පිළිතුරු තිත් ඉර මත ලියන්න.

| පිටු අංකය | | ලැබූ ලකුණු |
|---|---|---|
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |
| 06 | | |
| 07 | | |
| 08 | | |
| එකතුව | | |
| | අවසන් ලකුණු | |
| ඉලක්කමෙන් | | |
| අකුරෙන් | | |

| ප්‍රශ්න පත්‍ර අංක - 06 | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| පළමු පරීක්ෂක<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම් කළ බව සහතික කරමි. | V/II/S |
| දෙවන පරීක්ෂක<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/II/S |
| ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක<br>ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/II/S |
| ප්‍රධාන පරීක්ෂක<br>අධීක්ෂණය කළෙමි අවසාන ලකුණ නිවැරදිය. | V/II/S |

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

01. පහත සඳහන් කවි ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පෙරදිග ලෝකයේ බබළන මුතු ඇටය
පණ ඇති මහා සමුදුරු පවුරෙන් වටය
හෙළ දිවයින මාගෙයි මා ඉපදුණ රටය
ලොව අන් සියලු දිවයින් මේකට යටය

මහවැලි කැලණි වලවේ කළු යන ගංගා
සමනල කන්ද මුදුනේ සිට පැන නැංගා
බෑවුම් තැනිතලා හෙල් අතරින් රිංගා
මේවා ගලයි මිණිකැට දිය යට හංගා

අවුකන ගල් වෙහෙර ඇත මහ පිළිම තැනූ
සූකිරි වගෙයි පුත්තලමේ මිදුණු ලුණු
සීගිරි ගලේ සිතුවම් ලොව පුදුම වුණු
ආඩම්බරයි ලෝවාමහ පහයෙ කණු

i) 'දූපත' යන්නට කවියේ සඳහන් සමානාර්ථ පදය කුමක් ද? ...........................................

ii) පවුරක් සේ තිබෙන්නේ කුමක් ද? ...........................................

iii) ගංගා ගලා බසින්නේ කුමන ස්ථාන අතරින් ද? ...........................................

iv) මෙහි සඳහන් පරිදි දිය යට හංගා ඇත්තේ මොනවා ද? ...........................................

v) පිළිම දැක ගත හැකි ස්ථාන දෙකක් මෙහි සඳහන් වේ. එම ස්ථාන මොනවා ද? .............................

vi) ලොව පුදුමයට පත් කරන්නේ මොනවා ද?........................................... (ලකුණු 1X6=6)

02. සුදුසු විරාම ලකුණු යොදන්න.

i) ඔක්සිජන් ටිකක් දීලා බලමු යි කවුදෝ කීවා

03. දී ඇති වචන නිවැරදි ව ගළපා අර්ථවත් වාක්‍යයක් බැගින් ලියන්න.

i) සිසුහු / වෙත / පාසල / ඉසුඹුවට / පැමිණියහ / පසු / සිසිර

..........................................................................................................................

04. පහත අවස්ථාවලට ගැළපෙන ප්‍රස්තාව පිරුළ ලියන්න.

i) නුසුදුසු පුද්ගලයන්ට තනතුරු වරප්‍රසාද දීමෙන් අහංකාර වීම.

..........................................................................................................................

05. පහත සඳහන් වාක්‍ය ඒකවචනයට හරවා ලියන්න.

i) ගොවියෝ උදෑසනින් ම කුඹුරට ගියහ.

..........................................................................................................................

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

06. පහත එක් එක් ප්‍රශ්නයෙහි නිවැරදි අක්ෂර සහිත වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

i) අත්පොලසන් ii) අත්පොළසන් iii) අත්පොළශන්

i) උළුඅස්ස ii) උලුවස්ස iii) උළුවස්ස

i) කොට්ඨාෂය ii) කොට්ඨාසය iii) කොට්ටාශය

07. පහත සඳහන් වාක්‍යවල නිවැරදි ආඛ්‍යාතය තෝරා යටින් ඉරක් අඳින්න.

i) මොනරා පිල් විදහා ................................ (නැටුවෝ ය. / නැටුවේ ය.)

ii) නංගිලා ආඩම්බරයෙන් ........................... ( සිනාසුණේ ය. / සිනාසුණෝ ය.)

iii) මල්ලී රචනාවක් ......................... (ලිව්වෝ ය. / ලිව්වේ ය.)

iv) නැන්දා හැළප ......................... (සෑදුවෝ ය. / සෑදුවා ය.)

v) ගංගා උතුරා පිටාර ...................... (ගැලුවේ ය. / ගැලුවෝ ය.)

08. පහත ඉඟි වැකියේ අදහස ලියන්න.

i) අනූ නවයෙන් බේරුණා

..........................................................................................

09. විරුද්ධාර්ථ පද ලියන්න.

i) පිපෙනවා - .............................. ii) යහපත් - ..............................

10. ගිරවා යන්නෙහි ස්ත්‍රී ලිංග පදය ලියන්න.

.................................. (ලකුණු 1x16=16)

11. එක් එක් ඉංග්‍රීසි වචන සඳහා සිංහල වචනය ලියන්න.

i) Umbrella - ............................... ii) Wood Apple - ...............................

12. පහත දී ඇති ඉංග්‍රීසි වචන නිවැරදිව ගළපා අර්ථවත් වැකියක් බැගින් ලියන්න.

i) you / ready? / Are. ............................................................

ii) This / pencil? / your / Is

..........................................................................................

13. එක් එක් රූපය සඳහා යෙදෙන ඉංග්‍රීසි වචනය ඉංග්‍රීසි අකුරෙන් ම ලියන්න.

i)  .................................

ii)  .................................

(ලකුණු 1x6=6)

14. 'මුන්නාල්' යන දෙමළ වචනයට අදාළ සිංහල වචනය ලියන්න.

..........................................................................................

15. 'එනක්කු තන්නීර් වේණ්ඩාම්' යන දෙමළ වාක්‍යයේ අර්ථය සිංහලෙන් ලියන්න.

.................................................................... (ලකුණු 2x2=4)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

16. දහසස්ථානය 9, දස දහසස්ථානය 3, සියයස්ථානය 0, දහයස්ථානය 5, එකස්ථානය 4 වන සංඛ්‍යාව කුමක් ද?

..................................................

17. දී ඇති සංඛ්‍යා අවරෝහණ පටිපාටියට ලියන්න.
43 800, 43 905, 43 968, 43 389

..................................................

18. පහත දැක්වෙන රටාවල හිස්තැනට සුදුසු සංඛ්‍යාව ලියන්න.


i) 36, 29, 22, ........., ............

ii) 24, 33, 42, ........., ...........

19. පේළියක රඹුටන් පැළ 302 ක් ඇත. එවැනි පේළි හතරක ඇති රඹුටන් ගණන කීය ද?

..................................................

20. රූපයේ අඳුරු කර ඇති කොටස මුළු රූපයෙන් භාගයක් ලෙස ලියන්න.



..........................................

21. ගොඩනැගිල්ලක ජනේලවලට තිර දැමීමට තිර රෙදි 14 m ක් අවශ්‍යයි. දැනට තිර රෙදි 6m 50cm ක් තිබේ. තව කොපමණ තිර රෙදි ප්‍රමාණයක් අවශ්‍ය ද?

..........................................

22. නිමල්ගේ බර කමල්ගේ බර මෙන් දෙගුණයකි. කමල්ගේ බර 24kg 500g නම් නිමල්ගේ බර කොපමණ ද?

..........................................

23. වෙළෙන්දෙක් ළඟ පොල් ගෙඩි 48 ක් තිබේ. ඉන් $\frac{1}{4}$ විකුණූ පසු ඉතුරු පොල්ගෙඩි ප්‍රමාණය කොපමණ ද?

..........................................

24. පොල්තෙල් 5l 250ml ක් මිලි ලීටර 250 බැගින් කුඩා බෝතල්වලට ඇසුරුවේ නම් ඇසිරරිය හැකි බෝතල් ගණන කීය ද?


..................................................

25. මා ළඟ රුපියල් පන්සියයයේ නෝට්ටු 1 ක් රුපියල් සියයේ නෝට්ටු 2 ක් හා රුපියල් පනහේ නෝට්ටු 6 ක් තිබුණි. එයින් රුපියල් 250.00 ක් මා හට වියදම් වුයේ නම් මා ළඟ ඇති ඉතිරි මුදල කීය ද?


..................................................

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

26. මෙම ඔරලෝසුවේ දැක්වෙන්නේ පෙරවරු වේලාවකි. මෙම වේලාවට පැය 3 මිනිත්තු 15 ට පසු වේලාව කීය ද?



.................................................

27. 

i) මෙම ඝන වස්තුවේ නම ලියන්න.

.................................................

ii) මෙහි දාර ගණන කීය ද?

.................................................

(ලකුණු 2x12=24)


28. පහත බිල්පත සම්පූර්ණ කරන්න.

| ද්‍රව්‍යය | ප්‍රමාණය | ඒකක මිල රු. | ශත | මිල රු. | ශත |
|---|---|---|---|---|---|
| පරිප්පු | 2 kg | 165 | 00 | i) .......................... | |
| බිත්තර | 4 | ii) .......................... | | 112 | 00 |
| සහල් | 1kg 500g | 210 | 00 | iii) .......................... | |
| මුළු මුදල | | | | iv) .......................... | |

(ලකුණු 1x4=4)

29. සිසුන් වඩාත් කැමති සුරතල් සතුන් පිළිබඳ තොරතුරු ප්‍රස්තාරයේ නිරූපණය කර ඇත. ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| සුරතල් සතුන් | සිසුන් ගණන |
|---|---|
| පූසා | 24 |
| බල්ලා | 10 |
| ගිරවා | 16 |
| හාවා | 12 |




i) හාවාට වඩා පූසාට සිසුන් කී දෙනෙක් කැමති ද?

.......................................

ii) මෙහි සිටින මුළු සතුන් ගණන කීය ද?

.......................................

(ලකුණු 1x2=2)

අංක 30 සිට 59 තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුරු දී ඇති පිළිතුරු අසුරෙන් තෝරා යටින් ඉරක් අඳින්න.

30. සෑම විට ම අප තුළ ඇති කර ගත යුතු යහපත් චර්යාවකි.

i) බියාදු චර්යා ii) සහනශීලි චර්යා iii) අක්‍රමණශීලි චර්යා

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

31 ශ්‍රී ලංකාවේ ඒකදේශීය ශාකයක් නොවේ,

i) ගිරිතිල්ල ii) ගොඩපර iii) කොස්

32 එක් වරක් පමණක් ඵල දරන ශාකයක් වන්නේ,

i) කෙසෙල් ii) අඹ iii) ජම්බු

33. යම් ස්ථානයක විදුලිය තිබේදැයි බැලීමට භාවිතා කරන්නේ,

i) ඉස්කුරුප්පු නියන ii) නියන iii) ටෙස්ටරය

34. අඬියා ළිං බහුල ප්‍රදේශයකි.

i) අම්පාර ii) යාපහුව iii) යාපනය

35. පොදු වාහනයකි.

i) පා පැදිය ii) යතුරු පැදිය iii) දුම්රිය

36. අප විසින් අත්හල යුතු චර්යාවකි.

i) වැඩිහිටියන් දුටු විට නැගිටීම ii) වැඩිහිටියන් සමඟ එකට එක කීම

iii) කෑමට පෙර අත් සෙදීම.

37. පොදු ස්ථානවල දී අනුගමනය නොකළ යුතු දෙයකි.

i) මහ හඬින් දුරකථනයෙන් කතා කිරීම. ii) තම වාරය එනතුරු ඉවසීමෙන් බලා සිටීම.

iii) යහපත් ලෙස හැසිරීම.

38. මනස වෙහෙස කරන ක්‍රීඩාවකි.

i) ගුඩු පැනීම ii) කැරම් ගැසීම iii) වෙස් ඇඳීම




39. ඉස්ලාම් භක්තිකයන්ගේ ආගමික ස්ථානය

i) කෝවිල ii) පල්ලිය iii) දේවස්ථානය

40. මන්නාරම් ප්‍රදේශයේ ඇති ඉතා වටිනා පෞරාණික ශාකය

i) නුග ගසකි. ii) සියඹලා ගසකි. iii) බයෝබැබ් ගසකි.

41 ජලයට අයිස් කැටයක් දමා බැලූ විට පෙනෙන නිවැරදි ආකාරය වන්නේ,

i)  ii)  iii) 

42. මහවැලි සහ වලවේ ගංගා මුහුදට වැටෙන ස්ථානවලට ආසන්න නගර පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

i) ත්‍රිකුණාමලය, කළුතර ii) ත්‍රිකුණාමලය, කොළඹ මෝදර

iii) ත්‍රිකුණාමලය, අම්බලන්තොට

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

43. ආනත තල මගින් වැඩ පහසු කර ගන්නා අවස්ථාව නොවන්නේ,

i) ඉනිමන් දිගේ උස් ස්ථානයකට නැගීම.

ii) ලොරියකට බැරල් එකක් පැටවීම.

iii) කප්පියක් මගින් වතුර ඇදීම.


44. වැලියට දැමීමෙන් කල් තබා ගත නොහැකිය.

i) කරවල ii) කොස් ඇට iii) දෙහි

45. ජල වාෂ්පවලින් ලබා ගන්නා ප්‍රයෝජනයක් නොවේ.

i) පිට්ටු තැම්බීම ii) ඉදි ආප්ප තැම්බීම iii) බිත්තර තැම්බීම

46. චන්ද්‍රිකා තාක්ෂණයේ පියා ලෙස විරුදාවලිලත් මොහු,



i) ඩන්කන් වයිට් මහතා ii) සී.ඩබ්ලිව්. කන්නන්ගර මහතා

iii) ආතර් සී ක්ලාක් මහතා

47. අප ශරීරය ලෙඩ රෝගවලින් ආරක්ෂා කරන්නේ,


i) විටමින් ii) ප්‍රෝටීන් iii) කැල්සියම්

48. මදුරුවන්ගෙන් පමණක් බෝවන රෝග ඇතුළත් පිළිතුර,

i) ඩෙංගු, මහාමාරිය, කොළරාව ii) ඩෙංගු, බරවා, මැලේරියා

iii) ඩෙංගු, ජලභීතිකාව, පාචනය

49. මෙම ඇටවුම මගින් දැක ගත හැකි සිදුවීම වන්නේ,




i) දේදුන්නේ වර්ණ දැකගත හැකිවීම.


ii) සූර්ය ග්‍රහණයක් දැකගත හැකය.

ii) ජලය පිරිසිදු කරගත හැකිය.

50. උප්පැන්න, මරණ හෝ විවාහ සහතිකයක් ලබා ගැනීමට යා යුතු ස්ථානය,

i) ග්‍රාම නිලධාරි කාර්යාලය ii) සමෘද්ධි කාර්යාලය iii) ප්‍රාදේශිය ලේකම් කාර්යාලය

51. අව අටවක දිනයට සඳ නිරූපණය කරන චන්ද්‍ර කලාව කුමක් ද?



i) ii) iii)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com


52. ශ්‍රී ලංකාවේ මුහුදු වෙරළක් පිහිටන පළාතකි.

i) වයඹ ii) ඌව iii) සබරගමුව

53. වැඩබිමක නිතර ප්‍රදර්ශනය කළ යුතු ආදර්ශ පාඨය වන්නේ,


i) කම්මැලියාට දිවැස් ඇත. ii) පළමුව ආරක්ෂාව iii) පනින්න පෙර සිතා බලනු

54. විදුලි බුබුළ දැල්වෙන්නේ කුමන ඇටවුමේ ද?



i) ii) iii)

55. මෙම මැහුම් ක්‍රමය වන්නේ,



i) බ්ලැන්කට් මැස්ම.


ii) දම්වැල් මැස්ම.

iii) පිස්මේන්තු මැස්ම.

56. ඉල්ලම් කුර භාවිතා කරන කර්මාන්තය කුමක් ද?

i) කෘෂි කර්මාන්තය ii) පතල් කර්මාන්තය iii) කම්මල් කර්මාන්තය

57. මෙම රූපයේ දැක්වෙන්නේ,



i) අනිලමානය

ii) රූං පෙත්ත

iii) සුළං දිශා දර්ශකය

58. ජාතික කොඩියේ සිංහල ජාතිය නිරූපණය කරන්නේ,

i) කහ පැහැති සිංහ රූපයෙනි. ii) රතු පැහැති පසුබිමෙනි. iii) බෝ කොළ හතරෙනි.

59. ශ්‍රී ලංකාවේ මුලින් ම සෑද වූ වැව වන්නේ

i) තිසා වැව ii) බසවන්කුලම වැව iii) මින්නේරිය වැව

(ලකුණු 1x30=30)

60. ''ජලය අපට සම්පතකි.'' යන මාතෘකාව යටතේ වාක්‍ය තුනක් ලියන්න. සෑම වාක්‍යයක් ම වචන පහකට නො අඩු විය යුතුයි. උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතුය.

(ලකුණු 2x3=6)

01 ..............................................................................................................

02 ..............................................................................................................

03 ..............................................................................................................